
# 3 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා

**ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳවත්, ආර්ය ජනාවාස ව්‍යාප්තියේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා දේශපාලන ඉතිහාසයේ වැදගත් අවස්ථා පිළිබඳවත් තොරතුරු මෙම ඒකකය මගින් අධ්‍යයනය කිරීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.**


## ප්‍රාග් ඓතිහාසික යුගය

ප්‍රාග් ඓතිහාසික යුගය යනු ලිඛිත ඉතිහාසය ආරම්භවීමට පෙර අවධියයි. මෙරට විජයාවතරණයට පෙර යුගය ප්‍රාග් ඓතිහාසික යුගයයි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ලේඛනගත තොරතුරු වාර්තා වන්නේ ක්‍රි.පූ. 6 වන සියවසේ පමණ සිටය. එහෙත් ඊට පෙර සිට ශ්‍රී ලංකාව ජනාවාස ව තිබූ බව පුරාවිද්‍යාත්මක සාධකවලින් අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ. ලේඛනගත මූලාශ්‍ර නොමැති, පුරාවිද්‍යාත්මක සාධක මත පමණක් ගොඩනගන ඉතිහාසය අයත් අවධිය ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස හැඳින්වේ.




**සිතියම 3.1 - ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන**

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාස පිළිබඳ සාධක හමු වී ඇති ස්ථාන රාශියකි. රත්නපුර ප්‍රදේශයේ දියලු පස් තට්ටු අතර තිබී තිරුවානා සහ කහඳ පාෂාණවලින් සාදන ලද ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් හා වානර මානවයකුගේ යයි සිතිය හැකි දත් ද හමු වී ඇත. මෙම සාධක ශ්‍රී ලංකාවේ පැරණි ම ප්‍රාග් ඓතිහාසික ජනාවාසයකට අයත් යයි සැලකේ. මේවා පූර්ව ශිලා යුගයට අයත් සාධක ලෙස හැඳින්වේ.



**රූපය 3.1 - රත්නපුර නිධිවලින් හමු වූ ගල් මෙවලම්වල පින්තූර**

ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පුරා විද්‍යාත්මක සාධක ස්ථාන රාශියකින් ලැබී තිබේ. බුලත්සිංහල පාහියන්ලෙන, කුරුවිට ආසන්නයේ බටදොඹ ලෙන, කෑගල්ල ආසන්නයේ අත්තනගොඩ පිහිටි අලුලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස, කිතුල්ගල බෙලිලෙන ආදී ස්ථාන ඒවායින් කිහිපයකි. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා පිළිබඳ මානව අවශේෂ පාහියන්ලෙන, බටදොඹ ලෙන, බෙල්ලන්බැඳි පැලැස්ස ආදී ස්ථානවලින් සොයා ගෙන ඇත. නිල්ගල, බෙලිගල්ගේ හා රාවණා ඇල්ල ලෙන්වල කැණීම් මගින් ද මිනිස් ඇට කැබිලි සොයා ගෙන ඇත.


# ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසාගේ ජීවන රටාව



රූපය 3.2 - බලංගොඩ මානවයාගේ කල්පිත රූපය

ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාව පිළිබඳ කරුණු අධ්‍යයනයේ දී ඔවුන් ප්‍රයෝජනයට ගත් ආහාර, වාසස්ථාන, තම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා භාවිත කළ මෙවලම් ආදිය ගැන අවධානය යොමු කළ යුතු වේ.

මොවුන්ගේ වාසස්ථාන ප්‍රමාණයෙන් කුඩා වූ අතර, ඉන් අදහස් වන්නේ කුඩා පවුල් එකක් හෝ දෙකක් එම වාසස්ථානවල ජීවත්වන්නට ඇති බවයි. කිතුල්ගල කැණීම්වලින් සොයාගත් ආහාර පිසීම සඳහා භාවිත කළ ලිප් තරමක් කුඩා ඒවා වීම එයට සාක්ෂ්‍යයක් ලෙස දැක්විය හැකිය. ඒවා පවුල් වැඩි ගණනකට භාවිතය සඳහා ප්‍රමාණවත් නොවූ බව පැහැදිලි වේ. ආහාර සපයා ගැනීමේ පහසු ව, පවුල් ඒකක සංඛ්‍යාව කුඩා වීම කෙරෙහි බලපාන්නට ඇත. කිතුල්ගල කැණීම්වලින් ගොඩනැගිල්ලක සක්ක ගල් අත්තිවාරමක කොටසක් හමු වී ඇත. මෙම නිර්මාණය මෙයට වසර 12,500කට පෙර කාලයට අයත් යයි පිළිගැනේ.



රූපය 3.3 - ක්ෂුද්‍ර ගල් මෙවලම්වල පින්තූර

බලංගොඩ මානවයා ඉත්තෑවන්, ලේනුන්, වඳුරන් වැනි කුඩා සතුන් වැඩි වශයෙන් ආහාර ලෙස ගෙන ඇත. වල් ඌරන් හා ගෝනුන් වැනි විශාල සතුන්ගේ මස් ද ආහාරයට ගෙන ඇත. දිය හා ගස් බෙල්ලන් වර්ග ආහාර වේලේ වැදගත් තැනක් ගත් බව ලැබී ඇති බෙලිකටුවලින් පැහැදිලි වේ. ශාකමය ආහාර ලෙස වල් කෙසෙල්, කැකුණ ඇට, බැදි දෙල් ඇට ආදිය අනුභව කර ඇත. ගෝනල වැනි අල වර්ග ද ආහාර ලෙස ගෙන තිබේ. මීන් වසර 27000කට පෙර කාල වකවානුවක දී පවා ලුණු භාවිත කළ බවට ද බෙලිලෙනින් සාක්ෂ්‍ය හමු වී ඇත. බටදොඹ ලෙන වැනි අභ්‍යන්තරයේ පිහිටි ස්ථානවලින් මුහුදු බෙලිකටු හමුවීමෙන් වෙරළබඩ ප්‍රදේශ හා සබඳතා පැවැත් වූ බව ද පැහැදිලි වේ.

කිතුල්ගල බෙලිලෙන,බටදොඹලෙන,පාහියන්ලෙන ආදී ස්ථානවලින් එකල අනුගමනය කළ අවමංගල්‍ය සිරිත් විරිත් පිළිබඳ තොරතුරු අනාවරණය වී තිබේ. යමෙකු මිය ගිය විට සිරුර ඉවතට ගෙන ගොස් දමා, පසු ව ඇටකටු රැගෙන විත් නොගැඹුරු වළවල් හාරා තැන්පත් කර ඇති බව පෙනේ. මෙම හිස් කබල්වල ගුරුගල් ආලේප කර ඇත. බලංගොඩ මානවයා විසින් භාවිත කළ ජ්‍යාමිතික ක්ෂුද්‍ර ගල් මෙවලම් කැණීම්වල දී හමු වී ඇත. කිසියම් ජ්‍යාමිතික හැඩයක් ලබා ගැනීමේ අරමුණෙන් ආයුධයේ දාර දිගේ සියුම් පතුරු ඉවත් කරන ලද පාෂාණ මෙවලම් ක්ෂුද්‍ර ගල්මෙවලම් ලෙස හැඳින්වේ. මේවා බොහෝ විට ප්‍රමාණයෙන් සෙ.මී. 2 පමණ වී ඇත. සමහර මෙවලම් සෙ.මී. 4.5ක් තරම් වී ඇත.

මධ්‍ය ශිලා යුගයේ දී භාවිතයට ගත් කහඳ සහ තිරුවානා ගල් වලින් සාදා ගත් පොරොව,ඇඹරුම් ගල්, දගල් හා වංගෙඩි ආදිය ද වෙනත් ගල් මෙවලම් ද සොයාගෙන ඇත. මේවා විවිධ අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා භාවිත කරන්නට ඇත.

# ආර්ය ජනාවාස පිහිටුවීම

## විජය කථා පුවත

ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම පිළිබඳ විවිධ පුරාවෘත්ත, සාහිත්‍යමය මූලාශ්‍රයවල සඳහන් වේ. මහාවංසය, දීපවංශය යන වංශ කථා ඒ අතර ප්‍රධාන වේ. පාහියන් හිමිගේ වාර්තාවලත් හියුං ෂාං හිමිගේ වාර්තාවලත් ලංකාව ජනාවාසවීම පිළිබඳ තොරතුරු සඳහන් වේ. වලාහස්ස ජාතකය ද, ලංකාවට සංක්‍රමණිකයන් පැමිණි බවට තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍රයකි.


වංශකථාවලට අනුව ක්‍රි.පූ. 6වන සියවසේ මැද භාගයේ දී මුල්වරට ඉන්දියාවේ සිට සංක්‍රමණික ජන කණ්ඩායමක් පැමිණි බවට තොරතුරු ලැබෙයි. විජය ඇතුළු පිරිස ලංකාවට පැමිණි මුල් සංක්‍රමණික කණ්ඩායම ලෙස පිළිගැනේ. ඔවුන් පැවතෙන්නේ ආර්යයන්ගෙන් බැවින් ඔවුන් විසින් පිහිටුවන ලද ජනාවාස ආර්ය ජනාවාස ලෙස හැඳින්වේ.

මහාවංශයට අනුව, විජය ඉන්දියාවේ ලාට රට, සිංහපුර රජ කළ සිංහබාහු රජුගේ පුත් කුමරා ය. තරුණ වියේ දී විෂම ගති පැවතුම්වලින් යුතු වූ බැවින්, ජනතාව මොහුගේ නොමනා ක්‍රියා පිළිබඳ රජුට පැමිණිලි කළ බවත්, රජු විජය ඇතුළු සත්සියයක් පිරිස රටින් පිටුවහල් කළ බවත් මහාවංශයේ සඳහන් වේ .

මෙම පිරිස උතුරු ඉන්දියාවේ ලාට රට සිට භාරුකච්ච හා සුප්පාරක නැවු තොටු පසුකර ලංකාවේ වයඹ දිග වෙරළේ මල්වතු ඔය හා කලා ඔය අතර පිහිටි වෙරළබඩ ප්‍රදේශයට ගොඩබට බවත් එහි සඳහන් වේ. මෙම ප්‍රදේශය තම්බපණ්ණි නමින් ඔවුන් නම් කර ඇත.

මහාවංශයට අනුව මෙම පිරිස ලංකාවට පැමිණියේ බුදුන් වහන්සේ පිරිනිවන් පෑ දිනයේ දී ය. බුදුහු, තමන් වහන්සේ පිරිනිවන් පෑමට පෙර ශක්‍ර දේවේන්ද්‍රයා කැඳවූහ. අනාගතයේ බුදු සසුන ස්ථාපිත වන්නේ ලක්දිව නිසා, මේ පිරිසත් රටත් ආරක්ෂා කිරීම උන්වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයාට පැවරූ සේක. ශක්‍ර දේවේන්ද්‍රයා එම කාර්යය උපුල්වන් දෙවියන්ට භාර කරන ලදු ව, උපුල්වන් දෙවියන් පරිබ්‍රාජක වේශයෙන් පැමිණ පිරිත් නූල් බැඳ, පිරිත් පැන් ඉස ආරක්ෂාව සලසා දුන් බව මහාවංශයේ සඳහන් වේ.

මෙසේ ලංකාවට ගොඩබට පිරිසට කුවේණිය මුණගැසුණු බවත්, ඇය තම මායා බලයෙන් විජයගේ පිරිස පොකුණක සිරකරනු ලැබූ බවත් කියැවේ. අවසානයේ පිරිස සෙවීමට ගිය විජය කුමරුට, ආපසු එම පිරිස ලබා දුන් අතර, ඔහුට ලංකා රාජ්‍ය ලබා දීමට එකඟ වූ බවත් මහවංශයේ සඳහන් වේ.




**සිතියම 3.2**
**ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නයේ පිහිටීම**

ඉන්පසු කුවේණිය විසින් දෙන ලද සහලින් පිළියෙළ කළ බත් මෙම පිරිස අනුභව කළ බවත්, කුවේණිය විසින් අල්ලා ගන්නා ලද වෙළෙන්දන්ගේ නැව්වලින් ගත් සහල්වලින් මෙම ආහාර පිළියෙළ කරගත් බවත් එහි සඳහන් වේ.

එදින රාත්‍රී සිරීසවත්ථු නුවර උත්සවයක් පැවති බැවින් යක්ෂ ගෝත්‍රික මිනිස්සු එම නුවරට රැස් ව සිටියහ. කුවේණියගේ ආධාරය ඇති ව එම ගෝත්‍රිකයන් පරාජය කර විජය, ලංකා රාජ්‍යය ලබාගෙන ඇත.

ජනපද පිහිටුවා ගැනීමෙන් පසු ව විජය කුමරු අභිෂේකය ලැබිය යුතු බව ඇමතිවරුන්ගේ අදහස විය. ඊට විජය කුමරුගෙන් කැමැත්ත ලබාගෙන මෙහෙසිය ලෙස ඉන්දියාවේ මධුර පුරයෙන් පාණ්ඩ්‍ය කුමාරිකාවක් ගෙන්වා ගනු ලැබී ය. අභිෂේක ලත් විජය රජු තම්බපණ්ණි නුවර තම පාලන මධ්‍යස්ථානය කරගෙන අවුරුදු තිස් අටක් රජකම් කළේ ය. ඔහුගේ ඇමතියෝ ද අනුරාධ, උපතිස්ස, උරුවෙල හා විජිත යනුවෙන් ජනපද පිහිට වූහ.

## ආර්ය ජනාවාස ව්‍යාප්තිය

මෙරට ආර්ය ජනාවාස පිහිටුවීම එකවරම වූ සිද්ධියක් නො වේ. ජනාවාස ගොඩනැගීම හා ව්‍යාප්තිය වරින්වර පැමිණි ඉන්දීය සංක්‍රමණික කණ්ඩායම් නිසා සිදුවුවක් බව වංස කථාවල සඳහන් තොරතුරුවලින් පැහැදිලි වේ.

ක්‍රි.පූ. 6වන සියවසේ සිට වරින්වර ඉන්දියාවේ සිට මෙරටට පැමිණි සංක්‍රමණික කණ්ඩායම් කීපයක් ගැන වංශකථාවල සඳහන් වේ.

විජය කුමරු ඇතුළු පිරිස, විජය කුමරුගේ මෙහෙසිය ලෙස මධුරා පුරයෙන් ගෙන්වා ගත් කුමරිය ඇතුළු පිරිස, පඬුවස්දෙව් ඇතුළු පිරිස, භද්දකච්චානා ඇතුළු පිරිස සහ ඇගේ සොහොයුරන් ඇතුළු පිරිස මෙම ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ප්‍රධාන ජන සංක්‍රමණ ලෙස හැඳින්විය හැකි ය.

මෙම පිරිස් ලංකාවේ වයඹදිග සහ නැගෙනහිර වෙරළේ පිහිටි තොටුපළවලට ගොඩ බට අතර ස්ථිර පදිංචිය සඳහා තෝරා ගත්තේ වියළි කලාපයට අයත් ගංගා ආශ්‍රිත ප්‍රදේශයන් ය. ඊට හේතුව ඔවුනට සුපුරුදු ජීවනෝපාය වූ කෘෂිකර්මය, කරගෙන යාමට අවශ්‍ය භෞතික සාධක එම ප්‍රදේශවල තිබීමයි. තැනිතලා බිම්, සරුපස, ජල පහසුව ගොවිතැනට හිතකර දේශගුණය වැනි සාධක කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වූ බැවින් මෙම ප්‍රදේශ ජනාවාස සඳහා සුදුසු ප්‍රදේශ ලෙස තෝරාගෙන තිබේ.




**සිතියම 3.3 -**
**ආර්ය ජනාවාස දැක්වෙන සිතියම**

විජය ඇතුළු පිරිස ලංකාවේ වයඹ දිග වෙරළට ගොඩබට බැවින් ඔවුන්ගේ ජනාවාස කදම්බ නදී, ගම්භීර නදී සහ ගෝණ නදී ආශ්‍රිත ව ආරම්භ විය. මහාවංශයට අනුව විජය කුමරු තම්බපණ්ණි ජනාවාසය ද, අනුරාධ ඇමති විසින් අනුරාධ ගාමය ද, උපතිස්ස ඇමති විසින් උපතිස්ස ගාමය ද පිහිටුවා ගනු ලැබී ය. උදේනි, උරුවේල යන අනෙක් ඇමතිවරු ද තම නම්වලින් ගම් ඉදි කළහ. මෙම ජනපද සියල්ල මල්වතුඔය (කදම්බ නදී) හා කලාඔය (ගෝණ නදී) අසබඩ පිහිටුවන ලදී.

ඉන්පසු විජය කුමරුගේ මෙහෙසිය ලෙස මධුරාපුරයෙන් ගෙන්වා ගත් කුමරිය ඇතුළු පිරිසක් ද මෙහි පැමිණ පදිංචි වී ඇත.

භද්දකච්චානා කුමරිය ඇතුළු පිරිස් ලංකාවට ගොඩබැස්සේ ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි ගෝකණ්ණ (ත්‍රිකුණාමල) වරායෙනි. පඬුවස්දෙව් රජුගේ මෙහෙසිය බවට පත්වූයේ භද්දකච්චානා කුමරියයි. ඇයගේ සහෝදර පිරිස ද එම වරායෙන් ම ලංකාවට ගොඩ බැස ඇත. මෙම කුමාරවරුන් විජිතගාම, රාමගෝණ, දීඝගාම, රෝහණ යන ජනපද ලංකාවේ නැගෙනහිර හා ගිණිකොණ දෙසට වනසේ පිහිටුවා ගෙන ඇත.

බටහිර පෙදෙසෙහි කැලණි ගඟ අසබඩ කල්‍යාණි නමින් ජනපදයක් ද බිහි විය. ගිණිකොණ ප්‍රදේශයේ කරින්ද නදී අසබඩ මහාගාම නමින් ජනපදයක් ද කප්පකන්දර නදිය ආශ්‍රිත ව කාචරගාම ආදී ජනපද ද බිහිවිය. මෙම ජනපදය ප්‍රාග් ඓතිහාසික ජනාවාසයක් ලෙස ද පිළිගැනේ. මුල් ජනපද ගංගා නිම්න ආශ්‍රිත ව බිහිවුව ද ජනගහනයේ වර්ධනයත් සමග ජනපද රට අභ්‍යන්තරයට ව්‍යාප්ත විය.

## ආර්යයන්ගේ දේශපාලන ආර්ථික හා සමාජ සංස්කෘතික ක්‍රම

ආර්යයන් මෙරට පිහිටුවා ගත් මුල් ජනාවාස, "ගාම" ලෙස හඳුන්වා ඇත. අනුරාධගාම, උපතිස්සගාම ආදී ජනාවාස එයට නිදසුන් ය. ආර්ය ජනපද පිහිටි ප්‍රදේශවල පාලකයා "ගමණි'' නමින් හැඳින්විණ. කල්යාමේ දී ගමණිවරුන් අතුරින් බලවත් වූ පාලකයා "රජ" නමින් හැඳින්විණි.

ආර්යයන් ඉන්දියාවේ සිට මෙහි පැමිණ ජනාවාස පිහිටුවා ගත් කාලයේ දී ගොවිතැන, සත්ත්ව පාලනය, වෙළඳාම වැනි ආර්ථික කටයුතු ඉන්දියාවේ පැවතිණ. ආර්යයන් මෙහි පැමිණි පසු ව වුව ද එම ආර්ථික කටයුතුවල නියැලෙන්නට ඇත. ආර්යයන් පදිංචි වූ ප්‍රදේශවල භූගෝලීය පසුබිම විමසා බැලීමේ දී ගොවිතැනට හිතකර ප්‍රදේශ පදිංචියට තෝරාගෙන ඇති බව පැහැදිලි වේ. භද්දකච්චායානා සමග පැමිණි ඇගේ සහෝදරයෙකු වූ අනුරාධ නමැත්තා වැවක් ඉදි කළ බව ද සඳහන් වේ.

ආර්යයන් මෙරටට පැමිණි අවධියේ බ්‍රාහ්මණ ආගම, ඉන්ද්‍ර, සූර්ය වැනි දෙවිවරුන් ඇදහීම ඉන්දියාවේ පැවතුණි. ඔවුන් ඉන්දියාවේ පැවති ජෛන ආගම් පිළිබඳ ව ද දැන සිටින්නට ඇති බැවින්, මෙම ඇදහිලි ක්‍රම ලංකාවේ ද ව්‍යාප්ත වන්නට ඇත. එමෙන් ම බුද්ධාගම පිළිබඳ ව ද ඔවුන් දැන සිටින්නට ඇත.

**අභ්‍යාස**

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයා පිළිබඳ තොරතුරු සොයාගෙන ඇති ස්ථාන 4ක් නම් කරන්න.
2. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ප්‍රයෝජනයට ගත් ශාඛමය ආහාර ද්‍රව්‍ය මොනවා ද?
3. ආර්ය ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ජනපදය | ආශ්‍රිත ගංගාව අතීතයේ හැඳින්වූ නම | එම ගංගාවේ වර්තමාන නම |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා පිළිබඳ තොරතුරු ලැබී ඇති ස්ථාන සිතියමක ලකුණු කර නම් කරන්න.
2. ආර්ය ජනාවාස බිහිවීමට පදනම් වූ ගංගා හා ඒ ආශ්‍රිත ව පිහිටි ජනපද සිතියමක ලකුණු කර නම් කරන්න.

## පොළොන්නරු රාජධානියේ බිඳවැටීම දක්වා දේශපාලන ඉතිහාසය

### රාජ්‍යත්වය පිහිටුවීම

වංශකථා, සෙල්ලිපි ආදී ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් තොරතුරු අනුව රාජ්‍යත්වය ලංකාවේ වැදගත් ම දේශපාලන තනතුර විය. බුදු දහමේ බලපෑමත් සමග ජන සම්මතයෙන් බිහි ව ජනතාවගේ ආරක්ෂාව හා සුභ සිද්ධිය සඳහා පවතින්නක් ලෙස "රජ" තනතුර සමාජයේ පිළිගැනීමට ලක්විය.

ලංකාවේ මුල් ආර්ය ජනපදවල පාලකයා "ගමණී" යන නාමයෙන් හඳුන්වා ඇත. එමෙන් ම රජ යන විරුද නාමය මෙරට පාලකයන් භාවිත කර ඇත.

පණ්ඩුකාභය කුමරු ප්‍රථමයෙන් මහවැලි ගඟ ආශ්‍රිත ව පිහිටි ජනාවාසවල බලය තහවුරු කරගත් අතර පසු ව වයඹ දිග ප්‍රදේශයේ පිහිටි ජනාවාස ද එක්සත් කර අනුරාධපුරයේ රජු බවට පත් විය. පණ්ඩුකාභය රජු ස්වාධීන දේශපාලන ඒකක ලෙස පැවති මෙම ජනපද එක්සත් කර අනුරාධපුරයේ රජු බවට පත්වීම රාජ්‍යත්වය විකාශනයේ වැදගත් අවස්ථාවක් ලෙස සැලකීමට පිළිවන. අනුරාධපුරය සියලු නගර අංගයන්ගෙන් පරිපූර්ණ නගරයක් බවට පත් කළේ ය. එතුමා ලංකාවේ ග්‍රාම සීමා නියම කළ බව ද මහාවංශයේ සඳහන් වේ.

කෙසේ වුවද දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ්‍ය කාලය දක්වා ඉන්දියාවේ මෙන් පිළිගත් චාරිත්‍ර අනුව අභිෂේක උත්සව පැවැත්වූ බවට තොරතුරු ලැබී නැත. අශෝක අධිරාජයා විසින් අභිෂේකය සඳහා එවන ලද භාණ්ඩ (රාජ කකුධ භාණ්ඩ) උපයෝගී කොටගෙන දේවානම්පියතිස්ස රජු විධිමත් අභිෂේක උත්සවයක් දෙවනවරට ද පවත්වා ඇත. අශෝක රජු ප්‍රිය කළ "දේවානම්පිය" යන විරුද නාමය ද තිස්ස රජු භාවිතයට ගත්තේ ය. ඉන්පසු පාලකයන් හැඳින්වීම සඳහා "මහා රාජ" ('මහ රජ') යන නාමයත් භාවිතයට පැමිණ තිබේ. අභිෂේකය සිදු කිරීමට මෙහෙසියක් ද සිටිය යුතු විය. රජුගේ ප්‍රධාන බිසොව "අග්ගමහෙසි" නම් වූවාය. මහරජු යනුවෙන් හැඳින්වූයේ අනුරාධපුරයේ සිටි ප්‍රධාන රජු ය. ප්‍රාදේශීය පාලකයන් ද රජ යන නාමය භාවිත කර ඇත.

වසර 44ක් අනුරාධපුරයේ රජකළ එළාර රජු පරාජය කර අනුරාධපුරයත් රෝහණ රාජ්‍යයත් එක්කොට දුටුගැමුණු රජු ලංකාව එක්සේසත් කළේ ය. මෙය දිවයින එක ම රජකුගේ පාලනයට යටත් වූ අවස්ථාවට හොඳ ම උදාහරණයකි.

බුදු දහමේ බලපෑම් මත දශ රාජධර්මය අනුව රට පාලනය කිරීම රජුගේ වගකීමක් ලෙස සැලකිණ. භික්ෂූන් වහන්සේලාගේ අනුශාසනා ලබා ගැනීම ද රාජ්‍ය පාලනයේ දී වැදගත් කොට සලකා තිබේ. රජුගේ කාර්ය වූයේ ලෝක ශාසන දෙක ආරක්ෂා කිරීමයි. මෙහි ලෝක යනු මහජනයා වන අතර ශාසනය යනු බුදු සසුනයි. මහජනයා රැකීමට වැව් ඉදිකිරී ම ද, සසුන රැකීමට වෙහෙර විහාර ඉදිකිරීම ද රජුගේ යුතුකමක් සේ සැලකෙයි.

පෙර සිටි රජවරුන් අනුගමනය කළ පාලන නීතිරීති අනුගමනය කරමින් රට පාලනය කිරීමට ද රජවරු උත්සාහ දැරූහ. මේ අනුව "පෙර සිරිත" පාලන කටයුතු සඳහා යොදාගෙන තිබේ.

මෙසේ ක්‍රමික ව විකාශනය වූ රාජාණ්ඩු ක්‍රමය බොහෝ විට ජන සම්මතවාදී පාලන ක්‍රමයක් විය. රටේ ආරක්ෂාව සැලසීම, ආර්ථික හා ආගමික සේවා ඉටු කිරීම රජතුමාගෙන් ඉටු විය යුතු ප්‍රධාන වගකීම් හා යුතුකම් ලෙස සැලකිණ.

රාජ්‍ය පාලනයේ දී අමාත්‍යවරුන්ට වැදගත් ස්ථානයක් හිමි විය. වංශ කථාවල "අමච්ච" නමින් මොවුන් හඳුන්වා ඇත. "අමෙති", "අමත" වැනි නම් මොවුන් හැඳින්වීම සඳහා යොද ගෙන තිබේ.

රාජ්‍ය හිමිකම් පිළිබඳ සම්මතය වූයේ සහෝදරයාගෙන් සහෝදරයාට හෝ පියාගෙන් පුතාට රජකම උරුම වීමයි.

## පණ්ඩුකාභය රජතුමා සහ අනුප්‍රාප්තිකයෝ

පණ්ඩුකාභය රජතුමා පිළිබඳ විස්තර මහාවංශය හා දීපවංශය යන මූලාශ්‍රවල සඳහන් වේ. පණ්ඩුකාභය කුමාරයාගේ පියා දීඝගාමිණී ය. ඔහු භද්දකච්චායනා කුමරියගේ සහෝදරයෙකුගේ පුතෙකි. පණ්ඩුකාභය කුමරුගේ මව චිත්‍රා කුමරියයි. මේ අනුව පණ්ඩුකාභය කුමරු මුල් ආර්ය කණ්ඩායමක පරපුරෙන් පැවත එන්නෙකි.

පණ්ඩුකාභය කුමරු තම මවගේ සොහොයුරන් කීප දෙනෙකු සමග සටන් කර ඔවුන් පරදවා අනුරාධපුරයේ රජ තනතුරට පත් විය. ආර්ය ජනපද රැසක් එක්සත් කර ඒකීය පාලනයක් බිහිකිරීම මෙතුමාගෙන් ඉටු වූ වැදගත් දේශපාලන සේවාවයි. අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය විය. මෙම රජු අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා ද වේ. සංවිධානාත්මක වූ පාලන ක්‍රමයක් පණ්ඩුකාභය රජු විසින් ස්ථාපිත කරන ලදී. අනුරාධපුර නගරය, මාර්ග, සුසාන භූමි ආදී අංගවලින් සමන්විත සැලසුම් සහගත නගරයක් බවට පත් කළේ ය. මෙතුමා තම දසවන රාජ්‍ය වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා නියම කළ බව ද සඳහන් ය. නගර ගුත්තික නමින් තනතුරක් නගරය පාලනය සඳහා ඇති කරන ලදී. එම තනතුරට රජු විසින් තම වැඩිමහලු මාමා වූ අභය කුමරු පත් කරන ලදී. පණ්ඩුකාභය රජතුමා වසර 70ක් පමණ රට පාලනය කළේ ය.

පණ්ඩුකාභය රජුගෙන් පසු ඔහුගේ පුත්‍රයා වූ මුටසීව කුමරු රජ විය. ඉන්පසු ඔහු පුත් තිස්ස කුමරු රජ තනතුරට පත්විය.

මෙම රජතුමාගේ රාජ්‍ය කාලයේ දී ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍ය සමග සුහද සම්බන්ධතා ගොඩනගා ගෙන ඇත. රජවීමෙන් පසු තිස්ස කුමරු, ඉන්දියාවේ අශෝක අධිරාජයා වෙත තුටු පඬුරු රැගත් දූත පිරිසක් යැවූ අතර අශෝක රජතුමා විසින් තිස්ස රජතුමාගේ අභිෂේක උත්සවය චාරිත්‍රානුකූල ව පැවැත්වීමට අවශ්‍ය රාජ කකුධ භාණ්ඩ මෙම දූත පිරිස අත එවනු ලැබී ය.

ක්ෂත්‍රිය අභිෂේක උත්සව ක්‍රමයක ආරම්භය දේවානම්පියතිස්ස රජුගේ පාලන කාලයේ දී ආරම්භ විය. එතැන් සිට "දේවානම්පිය" යන විරුද නාමය ද භාවිත කළේය.

මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස ලංකාවට පැමිණීම හා බුදු සසුන ලංකාවේ පිහිටුවීම සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස පැමිණීම, භික්ෂුණී ශාසනය පිහිටුවීම හා ශ්‍රී මහා බෝධි රෝපණය දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ්‍ය කාලයේ සිදු වූ වැදගත් ආගමික සිදුවීම් ය. ශ්‍රී ලංකාවේ සංස්කෘතික නවෝදයක් ඇති කිරීමට මෙම සිදුවීම් හේතු විය.

දේවානම්පියතිස්ස රජතුමාගෙන් පසු ඔහුගේ සොහොයුරු උත්තිය කුමරු රජ විය. එම රජුගේ ඇවෑමෙන් ඔහුගේ සොහොයුරු වූ මහාසිව ද ඉන්පසු සූරතිස්ස කුමරු ද රජ විය. සූරතිස්ස රජුගේ කාලයේ දී සේන සහ ගුත්තික නම් දකුණු ඉන්දීය අශ්ව වෙළෙන්දෝ ලංකාවට පැමිණ රාජ්‍ය පැහැර ගෙන අවුරුදු 22 ක් රට පාලනය කළහ.


අසේල කුමරු, එම ආක්‍රමණිකයන්ගෙන් රට මුදගෙන අවුරුදු 10ක් රට පාලනය කළේ ය. අසේල රජුගේ කාලයේ දී එළාර නම් සොළී ආක්‍රමණිකයා ලංකාව ආක්‍රමණය කර අනුරාධපුරයේ රාජ්‍ය බලය පැහැර ගත්තේය.

එළාර රජු අවුරුදු 44ක් රාජ්‍ය කළ බව සඳහන් වේ. එළාර රජ සාධාරණ හා නීතිගරුක පාලකයෙකු බව මහාවංශයේ සඳහන් තොරතුරුවලින් පැහැදිලි වේ.

එළාර රජ අනුරාධපුර රාජ්‍ය පාලනය කරන කාලයේ කිරිඳිඔය (කරින්ද නදී) අසබඩ මාගම (මහාගාම) අගනුවර කරගෙන කාවන්තිස්ස රජතුමා රුහුණ පාලනය කළේ ය. එතුමාගේ බිසොව වූයේ විහාර මහා දේවිය යි. මෙම දෙදෙනාට ගැමුණු හා තිස්ස යනුවෙන් පුත්තු දෙදෙනෙක් වූහ. ගැමුණු කුමරු කුඩා කල සිට ම සොළීන්ගෙන් රට මුදා ගැනීමේ අභිප්‍රායෙන් පසු විය.

කාවන්තිස්ස රජතුමාගෙන් පසු රුහුණේ පාලනයට පත් ගැමුණු කුමරු අනුරාධපුරයේ රජ කළ එළාර රජ පරාජය කර ලංකාවේ ම රාජ්‍ය බලය ලබා ගත්තේ ය. එළාර රජු පරාජය කිරීමෙන් පසු සොළින්ට විරුද්ධ ව තවත් සටනක යෙදීමට දුටුගැමුණු රජුට සිදුවිය. විජිතපුර සටනේ දී පරාජය වූ එළාර ආධාර ඉල්ලා ඉන්දියාවට යැවූ පණිවිඩයකට පිළිතුරු වශයෙන් භල්ලූකගේ ප්‍රධානත්වයෙන් පැමිණි හමුදාව සමග එම සටන කිරීමට සිදු විය. එම සටනින් ද ජය ලබා ගැනීමට දුටුගැමුණු රජ සමත් විය.

විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගෙන මුළු දිවයින ම එක්සත් කළ පාලකයෙකු වශයෙන් දුටුගැමුණු රජුට ඉතා වැදගත් ස්ථානයක් හිමි වේ.




**සිතියම 3.4 දුටුගැමුණු රජුගේ සේනා ගමන්ගත් මාර්ගය දැක්වෙන සිතියම**

ක්‍රි.පූ. 161 සිට 137 දක්වා වසර විසිහතරක් ලංකාව පාලනය කළ මෙතුමා, එම කාලය තුළ බුදු සසුනේ දියුණුව සඳහා විශාල සේවාවක් සිදු කළේ ය. අනුරාධපුරයේ මිරිසවැටිය, රුවන්වැලි මහාසෑය, ලෝවාමහාපාය වැනි ආගමික සිද්ධස්ථාන ද එතුමා විසින් කරවන ලදී.

අනුරාධපුර යුගයට අයත් රජවරුන් අතර වළගම්බා රජතුමා ඉටු කළ දේශපාලන සේවාව ද ඉතා වැදගත් වේ.

ක්‍රි.පූ. 109 සිට 103 දක්වා වූ කාලයේ බල්ලාටනාග රජුගේ රාජ්‍ය කාලයයි. බල්ලාටනාග රජුගෙන්, මහාරත්ථක නම් සෙන්පතියා රජකම පැහැර ගත්තේ ය. රජකම ලබා ගත්ත ද ඔහුට රාජ්‍ය පාලනය කිරීමට ලැබුණේ දින පහක් වැනි සුළු කාලයකි. සද්ධාතිස්ස රජුගේ බාල පුතු වූ වට්ටගාමිණීඅභය (වළගම්බා) මහාරත්ථක සෙනවියා පරාජය කර ක්‍රි.පූ. 103 දී රජකමට පත් විය. තම පරපුරට හිමි විය යුතු රාජ්‍ය බලය නැවත ලබා ගැනීමට මේ අනුව ඔහු සමත් විය.

වළගම්බා රජු බලයට පත්වන විට දේශපාලන වශයෙන් රටෙහි ව්‍යාකූල තත්ත්වයක් පැවතිණ. රුහුණේ නකුල ග්‍රාමයේ තීය හෙවත් තිස්ස නම් බ්‍රාහ්මණයෙක් කැරැල්ලක් ඇති කළේ ය. රට තුළ මෙවන් තත්ත්වයක් පවතිත්දී සත්දෙනෙකුගෙන් සමන්විත දකුණු ඉන්දීය ආක්‍රමණික පිරිසක් ලංකාව ආක්‍රමණය කර රාජ්‍ය බලය ලබා ගත්හ. එම ආක්‍රමණිකයන් අතරින් එක් අයකු සෝමා දේවිය ද තවත් අයකු පාත්‍ර ධාතුව ද රැගෙන ආපසු ඉන්දියාවට ගොස් ඇත. පුලහත්ථ, භායිය, පනයමාර, පිළයමාර, දඨිය යන අය පිළිවෙළින් එකිනෙකා මරා ගනිමින් අවුරුදු 14ක් පමණ අනුරාධපුරයෙහි රජකම් කර ඇත.

රජු ආරක්ෂාව පතා මලය රටට පළා ගිය අතර, සැඟව සිටිය දී කුප්පික්කුල මහාතිස්ස නම් හිමිනමක් රජුට උපකාර කර තිබේ.

පසු ව මහත් දුෂ්කරතා මධ්‍යයේ සංඝයා වහන්සේලා හා මලය දේශයෙහි තනසීව නම් ප්‍රාදේශීය පාලකයකුගේ ද සහාය ඇති ව සේනා සංවිධානය කර ගෙන ක්‍රි.පූ. 89 දී නැවත සිහසුන ලබාගැනීමට වළගම්බා රජු සමත් විය. රාජ්‍යත්වයට පත්වීමෙන් පසු වළගම්බා රජතුමා අභයගිරි විහාරය කරවා, සැඟව සිටිය දී තමන්ට උදව් කළ මහාතිස්ස තෙරුන්වහන්සේට පූජා කරන ලදී. මෙය ලංකාවේ සිදු වූ ප්‍රථම පෞද්ගලික ආරාම පූජාවයි. අභයගිරි විහාරය මෙසේ පූජා කිරීම ලංකාවේ ප්‍රථම වරට නිකාය භේදයක් ඇති වීමට ද මුල් විය.

මෙතෙක් මුඛ පරම්පරාගත ව පවත්වා ගෙන ආ ත්‍රිපිටකය මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කිරීම ද මෙතුමාගේ රාජ්‍ය කාලයේ දී සිදු විය. වළගම්බා රජු සතුරන්ගෙන් රට මුදා ගැනීමෙන් පසු ක්‍රි.පූ. 89 සිට ක්‍රි.පූ. 77 දක්වා රාජ්‍ය කළේ ය.

අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය අධ්‍යයනය කරන විට වසභ රජතුමා රාජ්‍යත්වයට පත්වීම නව රජ පෙළපතක ආරම්භය සිදුවීම නිසා වඩාත් වැදගත් වේ. වසභ රජු ලම්බකර්ණ රජ පෙළපතේ ආරම්භක පාලකයා ය. වසභ රජතුමාගෙන් ඇරඹි ලම්බකර්ණ රාජ වංශය අවුරුදු තුන්සිය හැත්තෑවකටත් වැඩි කාලයක් පැවතිණ. වසභ රජු ක්‍රි.ව. 65 සිට ක්‍රි.ව. 109 දක්වා වසර 44 ක කාලයක් රට පාලනය කළේ ය. වසභ රජුගේ රාජ්‍ය කාලයට අයත් සෙල්ලිපි උතුරේ යාපන අර්ධද්වීපයෙන් ද, දකුණේ සිතුල්පව්ව, තිස්සමහාරාම ආදී ස්ථානවලින් ද නැගෙනහිරින් මඩකලපු දිස්ත්‍රික්කයෙන් ද බටහිරින් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ද හමුවී තිබේ. වසභ රජුගේ රාජ්‍ය බලය දිවයින පුරා ව්‍යාප්ත ව තිබූ බව මෙම මූලාශ්‍රයවලින් සනාථ වේ.

වැව් හා වාරිමාර්ග රැසක් ඉදිකර කෘෂිකර්මාන්තයේ දියුණුවටත්, වෙහෙර විහාර ආදිය ඉදිකර බුදු සසුනේ දියුණුවටත් විශාල සේවාවක් මෙම රජතුමා විසින් ඉටු කර තිබේ.

ක්‍රි.ව. 276 සිට 303 දක්වා ලංකාව පාලනය කළ මහසෙන් රජතුමාගේ රාජ්‍ය කාලය ඓතිහාසික වශයෙන් වැදගත් වේ. මොහු ගෝඨාභය රජුගේ බාල පුතා ය. මොහුට ශිල්ප උගන්වනු ලැබුවේ සංඝමිත්‍ර නම් දකුණු ඉන්දියාවෙන් පැමිණි වෛතුල්‍යවාදී (මහායානික) භික්ෂූන්වහන්සේ නමක විසිනි. මෙම භික්ෂූන් වහන්සේගේ බලපෑම මත මහසෙන් රජු මහායාන ධර්මය ප්‍රචාරය කිරීමට අනුග්‍රහය දැක්වී ය. රාජ අනුග්‍රහය ලැබීම මහායාන ධර්මයේ ව්‍යාප්තියට හේතු විය.

එසේ ම මහාවිහාරයට විරුද්ධ ව කටයුතු කිරීමට රජු මෙහෙයවීමට ද සංඝමිත්‍ර හිමි සමත් විය. මහාවිහාරික භික්ෂූන්ට දන් දුනහොත් දඩ පනවන බවට නියෝගයක් පැනවිණ. මේ නිසා මහා විහාරයේ භික්ෂූන් වහන්සේලා රුහුණ හා මලය ප්‍රදේශවලට වැඩම කිරීමෙන් අනුරාධපුරයේ මහජනයාට අවශ්‍ය මග පෙන්වීම ලබා දීමට කිසිවෙක් නො වූහ. මේ නිසා රජුට විරුද්ධ ව මහජන කැරැල්ලක් ද ඇති විය.

මේඝවර්ණාභය නම් ඇමතිවරයා එම කැරැල්ලට නායකත්වය ලබා දුනි. පසු ව මේඝවර්ණාභය හා රජු අතර පැවති සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස කැරැල්ල සමථයකට පත් විය. එයින් පසු රජතුමා මහාවිහාරය ප්‍රතිසංස්කරණය කළේ ය.

මහසෙන් රජු මහාවිහාර සීමාව තුළ ජේතවන විහාරය නමින් අලුත් සංඝාරාමයක් කරවා එය සාගලික නිකායට පවරා දුනි. එහි ගොඩනැගූ ජේතවන දාගැබ ලංකාවේ විශාල ම ස්තූපයයි.

ආගමික වශයෙන් ඇති වූ මෙම තත්ත්වයන් රටේ දේශපාලනය කෙරෙහි ද බලපෑ බව කැරලි ආදිය මතුවීමෙන් සනාථ වේ.

මෙවන් තත්ත්වයක් පැවතුණ ද මෙම රජතුමා මින්නේරිය, මාගල්ල, හුරුළු වැව ආදී වැව් රාශියක් කරවා කෘෂිකර්මාන්තය දියුණුවට ද කටයුතු කළේ ය. ජේතවනාරාමය, මින්නේරි විහාරය, ගෝකණ්ණ විහාරය, කලන්දක විහාරය ආදී වූ විහාර මෙතුමා විසින් කරවන ලදී.

මහසෙන් රජුගෙන් වාරි කර්මාන්ත ක්ෂේත්‍රයට සිදු වූ වැදගත් ම සේවය මින්නේරිය වැව ඉදිකර ඒ ප්‍රදේශය සශ්‍රීක කිරීම යි. මේ නිසා එතුමන් මින්නේරි දෙවියන් ලෙස ද හඳුන්වනු ලැබේ.

මිත්සෙන් රජතුමාගේ රාජ්‍ය කාලයේ දී නැවත වරක් දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් පිරිසක් විසින් ලංකාවේ රාජ්‍ය බලය පැහැර ගන්නා ලදී. පණ්ඩුපාරින්ද , බුද්ධපාරින්ද, තිරීතර, දඨිය, පීඨිය නම් වූ මොවුන් පිළිවෙළින් අවුරුදු විසිහතක් පමණ කාලයක් අනුරාධපුර රාජ්‍ය අත්පත් කොට ගෙන පාලනය කර ඇත.

මෙම ද්‍රවිඩ පාලකයන් පරාජය කර යළිත් රජරට නිදහස් කරගනු ලැබුවේ ධාතුසේන කුමාරයා ය. මොහු මෞර්ය වංශික කුමාරයෙකි. කුඩා කාලයේ සතුරන්ගෙන් ආරක්ෂා වීම සඳහා තම මාමා වූ තෙරුන්වහන්සේ නමක සමග අනුරාධපුරයේ විහාරයක පැවිදි ව සිටි බව සඳහන් වේ. සතුරන්ට එතරම් ළඟින් වාසය කිරීම ආරක්ෂා රහිත යයි සිතූ හිමි නම කලා ඔයෙන් දකුණේ විහාරයකට මොහු කැඳවා ගෙන ගොස් ඇත. පසු ව කුමරා පැවිදි ජීවිතය අත්හැර සේනා සංවිධානය කිරීමට පියවර ගෙන තිබේ. ද්‍රවිඩ පාලකයන් පරාජය කර ක්‍රි.ව. 459 දී ධාතුසේන රජු රාජ්‍යත්වයට පත් විය. ද්‍රවිඩ පාලනයෙන් රට මුදා ගෙන නැවත රාජ්‍යත්වය ස්ථාපිත කිරීම ධාතුසේන රජු ගෙන් සිදු වූ වැදගත් දේශපාලන සේවාව වේ. කලාවැව, යෝධ ඇළ හෙවත් ජය ගඟ කරවීම නිසා කෘෂිකාර්මික දියුණුවට ද මොහු විශාල මෙහෙයක් ඉටු කර ඇත. බුදු සසුනේ දියුණුවට ද විශාල අනුග්‍රහයක් දක්වා ඇත.

ධාතුසේන රජතුමා තම දෙවැනි බිසවකගේ පුතු වූ කාශ්‍යප අතින් මරණයට පත් වූ බව ඉතිහාසයේ සඳහන් වේ. කාශ්‍යප කුමරු මිගාර සෙන්පතියාගේ උපදෙස් අනුව කටයුතු කර ඇත. මිගාර ධාතුසේන රජුගේ බෑනා වූ අතර රජු සමග උරණ ව සිටියේ ය. කාශ්‍යප රාජ්‍යය බලය ලබාගත් අතර රාජ්‍යයට නීත්‍යානුකූල ව හිමිකම් තිබූ අග බිසවගේ පුත් මුගලන් කුමරු රාජ්‍ය ලබා ගැනීම සඳහා ආධාර සේනාවක් ලබාගැනීමේ අරමුණු ඇති ව ඉන්දියාවට ගියේ ය. සොහොයුරාගෙන් ආරක්ෂා වීම සඳහා කාශ්‍යප තම රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්තේ අනුරාධපුරයෙන් තරමක් ඈත් ව පිහිටි ආරක්ෂිත ස්ථානයක් වශයෙන් වැදගත් වූ සීගිරි පර්වතයයි.

කාශ්‍යප රජු එහි බලකොටුවක් ඉදිකර, පර්වතය මුදුනේ රජුගේ මාලිගාවත් වෙනත් ගොඩනැගිලිත් ඉදි කළේය. ඒවායේ නටබුන් දැනුදු දක්නට ලැබේ.

රාජ සභා මණ්ඩප, ජල උද්‍යාන, බිතු සිතුවම්, කැටපත් පවුර ආදී මෙහි ඇති නිර්මාණ අතර වැදගත් වේ. සීගිරිය රාජධානියක්, බලකොටුවක් මෙන් ම කලාගාරයක් ලෙස ද වැදගත් වේ.

ක්‍රි.ව. 477 සිට 495 දක්වා වසර 18 කාශ්‍යප රජතුමාගේ රාජ්‍ය කාලය ලෙස සැලකේ.

ක්‍රි.ව. 495 දී මුගලන් කුමරු ඉන්දියාවෙන් සේනාවක් රැගෙන පැමිණ කාශ්‍යප රජු පරාජය කර, සිහසුන ලබාගත්තේ ය.

අනුරාධපුර යුගයට අයත් රජවරුන් අතර පළමුවන අග්බෝ රජතුමා ද වැදගත් වේ. එතුමා වැව් හා වාරි මාර්ග තනවා කෘෂිකර්මාන්තයේ දියුණුව සඳහා විශාල මෙහෙයක් ඉටු කළේ ය. මෙතුමාගේ රාජ්‍ය කාලය (ක්‍රි.ව. 575 - 608) සාමය හා සෞභාග්‍යයෙන් යුතු කාලයක් විය.

පළමුවැනි අග්බෝ රජුගෙන් පසු දෙවැනි අග්බෝ රජ විය. (ක්‍රි.ව. 608 සිට ක්‍රි.ව. 618) මෙම රජු වාරි කර්මාන්ත කරවා කෘෂිකාර්මික දියුණුව ඇති කළේ ය. කන්තලේ හා ගිරිතලේ වැව මෙම රාජ්‍ය කාලයේ නිම වූ වාරිකර්මාන්ත ලෙස හැඳින්වේ. වලාහස්ස නම් වැව මේ රජු ප්‍රතිසංස්කරණය කළේය.

මෙම රජතුමාගේ රාජ්‍ය කාලයේ දී කාලිංග රටේ රජු තම බිසව හා ඇමතියා ද සමග රැකවරණ පතා ලංකාවට පැමිණ ඇත.


මේ අනුව මෙම රජු කාලිංග දේශය සමග සබඳතා පැවැත්වූ බව පැහැදිලි වේ.

අනුරාධපුර යුගයේ අග භාගයේ රාජ්‍යත්වයට පත් රජවරුන් අතුරින් සිව්වැනි මහින්ද රජු ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස හැඳින්වීමට පුළුවන. ක්‍රි.ව. 956 සිට 972 දක්වා වූ කාලය මෙම රජුගේ රාජ්‍ය කාලයයි. මෙම රජුගේ මෙහෙසිය වූයේ කාලිංග වංශික කුමාරිකාවකි. මොහු සිව්වැනි දප්පුල, තුන්වැනි උදය, තුන්වැනි සේන, සිව්වැනි උදය යන රජවරුන් යටතේ අවුරුදු තිහක පමණ කාලයක් රුහුණු ප්‍රදේශය පාලනය කර ඇත. සිව්වැනි සේන රජුගේ කාලයේ දී යුව රජු වශයෙන් ද කටයුතු කර ඇත. මෙම රජතුමා රජ වීමත් සමග සුළු කැරැල්ලක් ඇති වුව ද එය රජු විසින් මර්දනය කරන ලදී. මෙතුමාගේ රාජ්‍ය කාලයේ දී දෙවන පරන්තක නම් චෝළ රජුගෙන් එල්ල වූ ආක්‍රමණයකට ද මුහුණ දීමට සිදු විය. තුන්වන ක්‍රිෂ්ණ නම් රාෂ්ටකූට රජු ද උතුරු ප්‍රදේශය ආක්‍රමණය කර ඇත. මෙම ආක්‍රමණයන්ට මුහුණ දී තම රාජ්‍ය බලය ආරක්ෂා කර ගැනීමට රජු සමත් විය.

අනුරාධපුර යුගයේ අවසාන පාලකයා වූ පස්වන මිහිඳු රජතුමා ක්‍රි.ව. 982 සිට ක්‍රි.ව. 1017 දක්වා රජ කළේ ය. මෙම රජතුමා දක්ෂ පාලකයකු නොවූ බැවින්, වැසියෝ අය බදු ගෙවීම පවා පැහැර හැරියහ. කුලී හේවායන්ට වැටුප් නොගෙවීම නිසා ඔවුහු මාලිගාව වටලා වැටුප් ගෙවන ලෙස රජුට බලකර සිටියහ. මේ නිසා රජු ක්‍රි.ව. 992 දී රුහුණට පලා ගියේ ය. රජරට පාලනය මේ නිසා අවුල් සහගත තත්ත්වයකට පත් විය.

ක්‍රි.ව. 993 දී පළමුවන රාජ රාජ නම් චෝළ රජු ලංකාව ආක්‍රමණය කළේ ය. චෝළයෝ දිවයිනේ රජරට ප්‍රදේශය තම පාලනය යටතට ගත්හ. එය "මුම්මුඩි ශෝළ මණ්ඩලම්" යනුවෙන් නම් කරන ලදී. පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගත්හ. පොළොන්නරුව "ජනනාථ මංගලම්" හෙවත් "ජනනාථ පුරම්" යනුවෙන් හඳුන්වා ඇත.

## පොළොන්නරු යුගයේ වැදගත් පාලකයෝ




සිතියම 3.5 පළමුවන විජයබාහු රජුගේ සේනා ගමන් ගත් මාර්ගය දැක්වෙන සිතියම

ක්‍රි.ව. 1017 දී පළමුවන රාජේන්ද්‍ර ලංකාව ආක්‍රමණය කර මිහිඳු රජු සිරකරුවකු ලෙස චෝළ දේශයට ගෙන ගියේ ය. ක්‍රි.ව. 1029 දී මිහිඳු රජු එහි දී මිය ගියේ ය. ක්‍රි.ව. 1018 සිට 1070 දක්වා රජරට පාලනය කරනු ලැබුවේ චෝළ පාලකයන් විසිනි. එම පාලනය තුරන් කර ලංකාව එක්සේසත් කරනු ලැබුවේ පළමුවන විජයබාහු රජතුමා ය. මොහු කුඩා කල කීර්ති හෙවත් "කිත්ති" කුමරු නමින් හැඳින්විණි. පියා මහා සාමි මොග්ගල්ලානය. මව "ලෝකිතා දේවිය" නම් වූවා ය. කීර්ති කුමරුට රැකවරණ සපයනු ලැබුවේ බුද්ධරාජ හෙවත් බුදල්නා නම් සේනාධිපතියෙකි. කිත්ති කුමරු බුද්ධරාජගේ ආධාරයෙන් කේශධාතු කාශ්‍යප පරාජය කර ක්‍රි.ව. 1055 දී කතරගම පාලන මධ්‍යස්ථනය කරගෙන පළමුවන විජයබාහු නමින් රුහුණේ පාලකයා බවට පත් විය.

චෝළයෝ විජයබාහු රජුගේ බලය මැඩ පැවැත්වීමේ අදහසින් රුහුණ ආක්‍රමණය කළහ. මේ අවස්ථාවේ දී රජු සතුරාට මුහුණ නොදී, තම සේනා ශක්තිය විනාශවීමට ඉඩ නොතබමින් පාලන මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට ගෙන ගියේ ය.

සොළීන් යළිත් වරක් විජයබාහු රජුට විරුද්ධ ව ආක්‍රමණයක් මෙහෙයවන ලදී. මේ අවස්ථාවේ දී විජයබාහු රජුගේ සෙනෙවියන් වූ රවිදේව හා චල සොළීන්ට එකතු වී ඇත. රජු පලුට්ඨගිරි නම් ස්ථානයට පසු බැස, නැවත සොළීන් පරාජය කර පොළොන්නරුව තාවකාලික ව අල්ලා ගැනීමට සමත් විය. නමුත් සොළීන්ට ආධාරක සේනාංක ලැබීම නිසා විජයබාහු රජතුමාට වාකිරිගලට පසු බැසීමට සිදු විය.

පසු ව නැවත සේනා සංවිධානය කරගත් පළමුවැනි විජයබාහු රජු රුහුණේ මහානාගහුල නම් ස්ථානයේ සිට මාර්ග තුනක් ඔස්සේ හමුදව මෙහෙයවා චෝලයන් පරාජය කර පොළොන්නරුව අල්ලා ගෙන ක්‍රි.ව. 1070 දී රට නැවත එක්සේසත් කළේ ය.

ක්‍රි.ව. 1017 සිට ක්‍රි.ව. 1070 දක්වා පැවති චෝළ පාලනයෙන් රජරට මුද ගැනීම පළමුවැනි විජයබාහු රජතුමාගෙන් ඉටු වූ වැදගත් ම දේශපාලන සේවාව වේ. මහාවංශයේ දෙවන කොටස, පනාකඩු තඹ සන්නස හා අඹගමු සෙල්ලිපිය මෙම රජු පිළිබඳ තොරතුරු සපයන මූලාශ්‍රය කීපයකි. වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කර රටේ ආර්ථිකය නැවත නගා සිටුවීමටත්, බුදු සසුනේ දියුණුව සඳහාත් විශාල මෙහෙයක් මෙම රජතුමා විසින් සිදු කරන ලදී. මෙම රජතුමා සොළී තර්ජනයට මුහුණ දීම සඳහා කාලිංග දේශය හා පාණ්ඩ්‍ය දේශය සමග සබඳතා ඇති කර ගත්තේ ය. පළමුවන විජයබාහු රජු තිලෝකසුන්දරී නම් කාලිංග කුමාරියක් සරණපාවා ගත් අතර, මිත්තා නම් තම සොහොයුරිය පාණ්ඩ්‍ය කුමරෙකුට විවාහ කර දුන්නේ ය. බුරුමය සමග සබඳතා ගොඩනගා ගැනීම නිසා මෙම රජුට ආධාර පිණිස බුරුම රටින් වෙළඳ ද්‍රව්‍ය රැගත් නැව් පැමිණ ඇත. පළමුවැනි විජයබාහු රජතුමාගෙන් පසු, එතුමා විසින් එක්සත් කළ රට නැවත කොටස්වලට බෙදී ගියේ ය. එසේ බෙදී ගිය රට නැවත එක්සත් කරනු ලැබුවේ මහා පරාක්‍රමබාහු රජතුමා ය. (ක්‍රි.ව. 1153 - ක්‍රි.ව. 1186) මහාවංශය දෙවන කොටස, දෙවනගල සෙල්ලිපිය, ගල්විහාර පුවරු ලිපිය හා සංගමු විහාර සෙල්ලිපිය මෙම රජතුමා පිළිබඳ තොරතුරු හැදෑරීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍රය වේ.

කීර්ති ශ්‍රී මේඝ නම් සුළු පියාගේ ඇවෑමෙන් පරාක්‍රමබාහු කුමරු දක්ඛිණ දේශයේ පාලකයා බවට පත් විය. අගනුවර වූයේ පරාක්‍රම පුරයයි. එය වර්තමාන පඬුවස්නුවර ප්‍රදේශයයි. ඉන්පසු ඔහු මලය දේශය නමින් හැඳින්වූ ප්‍රදේශය සිය පාලනය යටතට ගත්තේ ය. ඉන් අනතුරු ව පොළොන්නරුවට පහර දුනි. මෙහි දී දෙවන ගජබාහු සමග මෙන් ම පොළොන්නරු සිහසුන අපේක්ෂාවෙන් සිටි රුහුණේ මානාභරණ සමග ද සටන් කිරීමට පරාක්‍රමබාහු කුමරුට සිදු විය. මෙම ගැටීම් මධ්‍යයේ පරාක්‍රමබාහු හා ගජබාහු රජු අතර ඇති වූ සම්මුතියක් ගැන සඳහන් වන අතර සංගමු විහාර සෙල්ලිපියෙන් එය තවදුරටත් තහවුරු වේ. එම සම්මුතියට අනුව දෙවන ගජබාහු රජුගේ මරණයෙන් පසු පොළොන්නරු සිහසුන පරාක්‍රමබාහු රජුට හිමි විය යුතු වුව ද මනාභරණගේ ඉදිරිපත් වීම නිසා ඔහු පරාජය කොට පොළොන්නරුවේ සිහසුන ලබාගැනීමට සිදු විය.

මනාභරණගෙන් පසු රුහුණ සුගලා බිසව යටතේ පාලනය විය. දන්තධාතූන් වහන්සේ සහ පාත්‍රා ධාතුව ඇය සතු ව තිබීම පරාක්‍රමබාහු රජුට රාජ්‍යත්වය තහවුරු කර ගැනීමට බාධාවක් විය. මේ නිසා රුහුණ ආක්‍රමණය කර සුගලා දේවිය පරාජය කර දන්තධාතූන් වහන්සේ හා පාත්‍රා ධාතුව ද ලබාගත්තේය. මෙසේ ලංකාව එක්සේසත් කර රාජ්‍යත්වය ද තහවුරු කර ගත්තේ ය.

පළමුවන පරාක්‍රමබාහු රජතුමා බුරුමය ආක්‍රමණය කර ජය ලැබූ බවත්, පාණ්ඩ්‍ය දේශයේ සිහසුන සඳහා ඇති වූ අරගලයේ දී පරාක්‍රම පාණ්ඩ්‍යයන්ගේ ඉල්ලීමක් පරිදි, සේනාවක් එහි යැවූ බවත් සඳහන් වේ. කෘෂිකර්මාන්තයේ දියුණුවට ද විශාල මෙහෙයක් මෙම රජතුමා විසින් ඉටු කෙරිණ. තුන් නිකාය සමගි කර වෙහෙර විහාර ඉදිකර බුදු සසුනේ දියුණුව සඳහා ද කටයුතු කළේ ය.

පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගෙන් පසු රාජ්‍ය උරුමකම් කීමට පුතෙකු හෝ සහෝදරයකු නොවූ බැවින්, පරාක්‍රමබාහු රජුගේ නැගණියගේ පුත් දෙවන විජයබාහු රජ විය. ඔහුගේ රාජ්‍ය කාලය අවුරුද්දකට සීමා විය. ඉන් පසු සවන මහින්ද රජ වූ නමුත් ඔහුගේ රාජ්‍ය කාලය දින පහකට සීමා විය.

ක්‍රි.ව. 1187 දී නිශ්ශංකමල්ල රජ වූ අතර ක්‍රි.ව. 1196 දක්වා ඔහු රාජ්‍ය පාලනය කළේ ය. මොහු කාලිංග වංශිකයෙකි.

පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඇති කළ දේශපාලන එක්සත් බව තව දුරටත් තම රාජ්‍ය කාලය තුළ පවත්වාගෙන යාමට මෙම රජු සමත් විය. කාලිංග වංශිකයන්ට රජකමට ඇති අයිතිය පිළිබඳ ඔහු ගල්පොත ලිපිය ඇතුළු සෙල්ලිපි මගින් අවධාරණය කර ඇත. වැඩි ම සෙල්ලිපි පිහිටුවා ඇත්තේ මෙම රජතුමා ය. මේවා අතරින් දීර්ඝතමය ගල්පොත ශිලාලේඛනය වේ.

දුර බැහැර පළාත්වල විසූ ජනතාව සමග සබඳතා ගොඩනගා ගැනීමට මෙම රජතුමා උත්සාහ දරා ඇත. රුහුණු, මායා, පිහිටි ප්‍රදේශවල චාරිකාවේ යෙදුන බැව් සඳහන් වීමෙන් එය පැහැදිලි වේ. එසේ ම මොහු කැලණිය, මහියංගනය වැනි බෞද්ධ - සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමට ද ගිය බව සඳහන් වේ.

නිශ්ශංකමල්ල රජතුමා වැසියන්ට බදු සහන ලබා දෙමින් ද, ධන පරිත්‍යාග කරමින් ද කටයුතු කර ඇත. මේ රජතුමා "තුලාභාර" දන් දී ඇත. යම් තැනැත්තෙකු බරට සමානවන ලෙසට කරනු ලබන දීමනා තුලාභාර දන ලෙස හැඳින්වේ. රජතුමාගේ, දරුවන්ගේ හා බිසවගේ බරට සමාන ව තුලාභාර දන දුන් බව සඳහන් වේ. මෙම රජු පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කළ බව ද සඳහන් වේ.

## දකුණු ඉන්දීය ආක්‍රමණ

අනුරාධපුර යුගයේ මුල් කාලයේ සිට වරින්වර දකුණු ඉන්දීය ආක්‍රමණවලට මුහුණ දීමට සිදු විය. බොහෝ විට ශ්‍රී ලංකාවේ පාලන ක්ෂේත්‍රය තුළ අවුල් සහගත තත්ත්වයන් ඇති වී පාලනය දුර්වල වූ අවස්ථාවල මෙන් ම දුර්වල පාලකයන් බලයට පත් වූ අවස්ථාවල දී ද එවන් ආක්‍රමණ එල්ල වී තිබේ.

මහාවංශයට අනුව ප්‍රථම දකුණු ඉන්දීය ආක්‍රමණය එල්ල වූයේ සූරතිස්ස රජතුමාගේ කාලයේ ය. එම ආක්‍රමණය සේන සහ ගුත්තික නම් අශ්ව වෙළඳුන් දෙදෙනෙකු විසින් මෙහෙයවා ඇත. අනුරාධපුරය යටත් කළ ඔවුහු අවුරුදු 22ක් පාලනය ගෙන ගියහ.

මෙම ආක්‍රමණිකයන්ගෙන් රට බේරා ගනු ලැබුවේ අසේල රජතුමා විසිනි, ඔහුගේ පාලන කාලයේ දී චෝළ ආක්‍රමණයක් එල්ල විය. එය මෙහෙයවනු ලැබුවේ එළාර රජතුමා විසින් ය. එළාර අවුරුදු 44ක් අනුරාධපුරය පාලනය කළේ ය. එළාර ධාර්මික රජකෙනෙකු බව මහාවංශයේ සඳහන් වේ. ක්‍රි.පූ. 161 දී දුටුගැමුණු රජතුමා එළාර රජ පරාජය කර අනුරාධපුරයේ බලය ද තහවුරු කරගෙන මුළු ලංකාව ම එක්සත් රටක් බවට පත් කළේ ය.

වළගම්බා රජු බලයට පත්වීමෙන් පසු පුලහත්ථ ඇතුළු දකුණු ඉන්දීය නායකයෝ හත් දෙනෙක් සේනාව රැගෙන ලංකාවට පැමිණ රාජ්‍ය බලය පැහැර ගත්හ. ඔවුන්ගෙන් පස් දෙනෙකු අවුරුදු 14ක් අනුරාධපුරය පාලනය කර ඇත. අවුරුදු 14කට පසු ක්‍රි.පූ. 89 දී වළගම්බා රජු නැවත පාලන බලය ලබාගැනීමට සමත් විය. ඔවුන්ගෙන් දෙදෙනෙකු පාත්‍රා ධාතුව ද සෝමා දේවිය ද රැගෙන ගොස් ඇත.

මිත්සෙන් රජතුමාගේ රාජ්‍ය කාලයේ දී පණ්ඩුපාරින්ද, බුද්දපාරින්ද, තිරීතර, දඨිය, පිඨිය යන දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් ලංකාව ආක්‍රමණය කර ඇත. ඔවුන්ගේ අවුරුදු 27 ක පමණ පාලන කාලයකින් පසු රට එක්සත් කරනු ලැබුවේ ධාතුසේන රජතුමා ය. පළමුවන සේන රජුගේ කාලයේ දී පාණ්ඩ්‍ය දේශයෙන් පැමිණ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ලංකාව ආක්‍රමණය කළ ද ඔහු වස්තුව කොල්ලකා ආපසු ගිය බව සඳහන් වේ.

හතරවන මිහිඳු රජතුමාගේ රාජ්‍ය කාලයේ දී රාෂ්ට්‍ර කූටයේ තුන්වන ක්‍රිෂ්ණ අනුරාධපුර රාජධානියට ආක්‍රමණයක් එල්ලකර ඇත.

මෙම රජතුමාගේ රාජ්‍ය කාලය තුළ දෙවන පරන්තක නම් චෝළ රජු ද, මෙරට ආක්‍රමණය කළ බව කියැවේ. ක්‍රි.ව. 993 දී පළමු වන රාජ රාජ නම් සොළී රජු ලංකාව ආක්‍රමණය කළේ ය. මේ වන විට පැවති අර්බුදකාරී දේශපාලන තත්ත්වය නිසා පහසුවෙන් ඔහුට රජරට යටත් කර ගැනීමට හැකි විය.

ක්‍රි.ව. 1017 දී පළමුවන රාජේන්ද්‍ර රුහුණ ආක්‍රමණය කර පස්වන මිහිඳු රජු සිරකරුවකු ලෙස ඉන්දියාවට රැගෙන ගියේ ය. ඔවුන් විසින් පොළොන්නරුව තම පාලනය මධ්‍යස්ථානය ලෙස තෝරාගනු ලැබිණි. මෙතැන් සිට අගනුවර වූයේ පොළොන්නරුවයි. ක්‍රි.ව. 1070 දී පළමුවන විජයබාහු රජු විසින් පොළොන්නරුව චෝල පාලනයෙන් මුදගනු ලැබී ය. නිශ්ශංකමල්ල රජතුමාගෙන් පසු පොළොන්නරුව රාජධානියේ ප්‍රබල පාලකයන් බිහි නොවූ බැවින් දේශපාලන වශයෙන් ව්‍යාකුල තත්ත්වයක් ඇති වී තිබේ. මෙකල සේනාපතිවරු බලවත් වූහ. ඔවුන් විසින් රජවරුන් බලයෙන් පහකරන ලදී. මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ක්‍රි.ව. 1215 දී කාලිංග මාඝ පොළොන්නරුවේ අවසාන රජු වූ පරාක්‍රම පාණ්ඩ්‍ය පරාජය කර බලය ලබා ගත්තේ ය.

කාලිංග මාඝ විසින් රාජ්‍යයට හිමිකම ඇති කුමාරවරුන් ඝාතනය කළ බවත්, භික්ෂූන් වහන්සේලාට සහ ප්‍රභූන්ට ඔහු විසින් වධ හිංසා පැමිණ වූ බවත්, පොත් පත් හා වෙහෙර විහාර විනාශ කරන ලද බව ද පූජාවලියේ සහ මහාවංශයේ තුන්වන කොටසේ දැක් වේ.

**අභ්‍යාස**

පහත දැක්වෙන වගු සටහන් සම්පූර්ණ කරන්න.

| යුගය | ලංකාව පාලනය කළ රජ හා රාජ්‍ය කාලය | ආක්‍රමණිකයාගේ නම / ආක්‍රමණික කණ්ඩායමේ නම |
|---|---|---|
| අනුරාධපුර යුගය | 1. ........................................ | ................................................... |
| | 2. ....................................... | ................................................... |
| පොළොන්නරු යුගය | 1. ........................................ | ................................................... |
| | 2. ........................................ | ................................................... |

| මූලාශ්‍රය | පිහිටුවන ලද රජ හා රාජ්‍ය කාලය |
|---|---|
| 1. ගල්පොත සෙල්ලිපිය | ........................................................................ |
| 2. පනාකඩුව සන්නස | ........................................................................ |
| 3. ගල්විහාර ලිපිය | ........................................................................ |
| 4. අඹගමු සෙල්ලිපිය | ........................................................................ |
| 5. දෙවනගල සෙල්ලිපිය | ........................................................................ |

## ක්‍රියාකාරකම

ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත් රජවරුන් කීපදෙනෙකුගේ නම් පහත දැක්වේ.

1. පණ්ඩුකාභය රජ
2. දුටුගැමුණු රජ
3. දේවානම්පියතිස්ස රජ
4. පළමුවන විජයබාහු රජ
5. වළගම්බා රජ

**මෙම එක් එක් රජවරුන් පිළිබඳ පහත සඳහන් අනුමාතෘකාවලට අදාළ ව කරුණු රැස් කරන්න.**

1. රාජ්‍ය බලය ලබාගත් ආකාරය
2. මුහුණ පෑමට සිදු වූ අභියෝග
3. ආගමික මෙහෙවර

## සාරාංශය

✪ ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා පිළිබඳ පුරා විද්‍යාත්මක සාක්ෂ්‍ය දිවයිනේ විවිධ ස්ථානවලින් හමුවී තිබීම.

✪ ක්‍රි.පූ. 6වන සියවසේ සිට වරින්වර ආර්ය සංක්‍රමණ සිදු වූ බව.

✪ ගංගා ආශ්‍රිත තැනිතලා බිම්වල එම ජනාවාස ව්‍යාප්තිය සිදු විය.

✪ ආර්යයන්ගේ දේශපාලන ආර්ථික හා සමාජ සංස්කෘතික ක්‍රමවල විශේෂ ලක්ෂණ

✪ අනුරාධපුර රාජධානියේ ආරම්භයේ සිට පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම දක්වා රජවරුන් හා වැදගත් දේශපාලන සිදුවීම්.

✪ අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා වරින්වර දකුණු ඉන්දීය ආක්‍රමණයන් එල්ල වූ බව.

## වැඩිදුර කියවීමට පොත්

☞ ශ්‍රී ලංකාවේ ඉතිහාසය I, II - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

☞ ලංකා විශ්ව විද්‍යාලය ලංකා ඉතිහාසය - I, II

☞ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය - ආචාර්ය ශිරාන් දැරණියගල